# ප්‍රයොරිටි පාස් (Priority Pass)

මෙම පිරිනැමීම, නිදහස් සංචාරයන් හා විශිෂ්ට ගමනාන්තයන් සිය ජීවන රටාවේ තවත් කොටසක් වශයෙන් සලකනු ලබන ඔබටයි. ඔබ පියාසර කිරීමට තෝරාගන්නා ගුවන් සමාගම සහ පංතිය කුමක් වුවත්, සංචාරයේ දී ගුවන් තොටුපළක සිටින කාලය තුළ ඔබේ සිත නිදහස් ව තැබීමට අප කැමතිය. ප්‍රයොරිටි පාස් (Priority Pass) සමග අප හවුල්කාරත්වය දරන බැවින් ලෝකයේ විශාලතම ස්වාධීන Lounge වැඩසටහන හරහා විශේෂ අමුත්තන් සඳහා වන සිත සනහන විවේකාගාර (VIP Lounge) වෙත පිවිස, ගුවන් තොටුපළවල සාමාන්‍යයෙන් ඇති කලබලකාරී බවින් මිදීමට ඔබට හැකි ය.

ගුවන් තොටුපල 600ක ට අධික සංඛ්‍යාවක VIP Lounge වෙත පිවිසීමට ඔබ සතු යතුරයි මේ

HSBC Visa Signature කාඩ්පත් හිමියෙකු වශයෙන්, එක් වාරයකට ඇ.ඩො. 25/-ක විශේෂ ගාස්තුවක් මත, ලෝකයේ ගුවන් තොටුපළ 600ක ට අධික සංඛ්‍යාවක VIP Lounge වෙත පිවිසීමේ හැකියාව භුක්ති විඳින්න.

මෙහි සඳහන් නීතිරීති සහ කොන්දේසිවලට අනුව කටයුතු කිරීම අනිවාර්ය වේ. වැඩි විස්තර සඳහා කරුණාකර www.prioritypass.com වෙත පිවිසෙන්න. නැතිනම්, අපගේ වෙබ් අඩවිය වන www.hsbc.lk හි විවේකාගාර නාමාවලිය (lounge directory) බලන්න.

පසු පිටෙහි ඇති 'නිතර අසන ප්‍රශ්න' කොටස මගින් වැඩි දුර තොරතුරු ආවරණය කර ඇත.

ප්‍රඃ **Priority Pass යනු කුමක් ද?**

පිඃ Priority Pass යනු ගුවන් තොටුපල විවේකාගාරයන් වෙත පිවිසීමේ හැකියාව ලබාදෙන ලොව විශාලතම ස්වාධීන වැඩසටහනයි. ලෝකයේ 600ක ට අධික VIP Lounge වෙත සැණින් පිවිසීමේ සුදුසුකම Priority Pass කාඩ්පත මගින් ඔබට හිමි වේ. ඔබ වෙනුවෙන් ම සැකසුනු ඔබේ Priority Pass කාඩ්පත, ඔබේ HSBC Visa Signature ක්‍රෙඩිට් කාඩ්පත සමග නොමිළේ ම ඔබට ලැබේ.

ප්‍රඃ	මාගේ Priority Pass කාඩ්පත භාවිත කළ හැක්කේ කුමක් සඳහා ද?

පිඃ	ලැයිස්තුගත කර ඇති ගුවන් තොටුපලවල විශේෂ අමුත්තන් සඳහා වන විවේකාගාර (VIP Lounge) අතරින් ඕනෑම විවේකාගාරයක් වෙත සැණින් පිවිසීම සඳහා ඔබට භාවිත කළ හැකි ය. අවලංගු කිරීම් සහ ගුවන් යානාවන් ප්‍රමාදවීම්වල දී ඇතිවන කලබලකාරී ගතියෙන් සහ පිටවීමේ ශාලාවල පිරී ඉතිරෙන මගීන්ගෙන් මිදී, ඔබේ ගුවන් යානය වෙත යන තෙක් සුව පහසුවෙන් සිටින්නට ඔබට අවශ්‍ය සෑම දෙයක් ම එකී විවේකාගාරයන් හි ඇත. සහභාගිවන විවේකාගාර පිළිබඳ වැඩි විස්තර සඳහා www.prioritypass.com වෙත පිවිසෙන්න.

ප්‍රඃ	Priority Pass කාඩ්පත මා හට ලැබෙන්නේ නොමිළයේ ද?

පිඃ	ඔව්. වටිනා HSBC Visa Signature කාඩ්පත් හිමියකු වන ඔබේ Priority Pass කාඩ්පත ඔබට ලැබෙනුයේ සම්පූර්ණයෙන් ම නොමිළයේ ය. කෙසේ වෙතත් විවේකාගාරයන් හි දී ඔබේ Priority Pass කාඩ්පත භාවිත කරන විට අය කෙරෙන ගාස්තුවක් ඇත.

ප්‍රඃ	Priority Pass කාඩ්පත භාවිත කිරීම සඳහා මා විසින් ගෙවිය යුතු මුදල කොපමණ ද?

පිඃ	ලොව පුරා පිහිටි, සහභාගි වන විවේකාගාරයන් වෙත පිවිසීමට ඔබ විසින් ඔබේ Priority Pass කාඩ්පත භාවිත කරන විට එක් වරකට එක් අයෙකු සඳහා ඇ.ඩො.25/-ක ගාස්තුවක් අය කෙරෙනු ඇත.

ප්‍රඃ	මාගේ කාඩ්පත භාවිතයෙන් මා හට පිවිසිය හැකි ගුවන් තොටුපල විවේකාගාර මොනවා ද?

පිඃ	ඔබගේ Priority Pass සාමාජික කාඩ්පත භාවිතයෙන් ඔබට පිවිසිය හැකි ගුවන් තොටුපල විවේකාගාර සංඛ්‍යාව 600ක ට අධික වේ. විවේකාගාර ලැයිස්තුව සඳහා කරුණාකර www.prioritypass.com වෙත පිවිසෙන්න.

ප්‍රඃ	මාගේ මිතුරු මිතුරියන් හෝ පවුලේ සාමාජිකයන් මා සමග විවේකාගාරය වෙත රැගෙන යා හැකි ද?

පි:	ඔව්, ඔබට එසේ කළ හැකියි. එක් අමුත්තෙකු සඳහා ඇ.ඩො.27/-ක ගාස්තුවකට ඔබ සමග විවේකාගාරය වෙත යාමට ඔබේ අමුත්තන්ට ආරාධනා කළ හැකි ය. සීමා පැනවීමක් තිබුණහොත් හැරෙන්නට බොහෝ විවේකාගාර ඕනෑම අමුත්තන් සංඛ්‍යාවක් සඳහා අවසර ලබා දේ. www.prioritypass.com හි විවේකාගාර නාමාවලියෙහි විස්තර දක්වා ඇත.

ප්‍ර:	මාගේ කාඩ්පත භාවිත කළ විට මා හට භුක්ති විඳිය හැකි සේවාවන් මොනවා ද?

පි:	ආහාර, පාන වර්ග සහ පුවත්පත්, Wi-Fi ඇතුළුව ගුවන් තොටුපල විවේකාගාරයක ඇති සියලු පහසුකම් වෙත පිවිසීමේ හැකියාව ඔබේ Priority Pass කාඩ්පත ඔබට ලබා දේ. කෙසේ වෙතත් විවේකාගාර කිහිපයක පමණක් ඇතැම් සීමාකිරීම් තිබිය හැකි ය. කාඩ්පත භාවිත කිරීමට පෙර, ඔබ පිවිසීමට අදහස් කරන විවේකාගාරය පිළිබඳ සම්පූර්ණ විස්තරය www.prioritypass.com වෙතින් ලබාගැනීම උචිත යැයි අප සිතමු.

ප්‍ර:	මා විවේකාගාරයක් වෙත ගිය විට මා විසින් කළ යුත්තේ කුමක් ද?

පි:	ඔබේ කාඩ්පත ඉදිරිපත් කරන්න. රිසිට්පත අත්සන් කරන්න. ඔබට පිරිනමන සේවාවන් භුක්ති විඳින්න. සේවාවන් භාවිත කරන අවස්ථාවේ දී ඔබ විසින් කිසිදු ගෙවීමක් සිදු කළ යුතු නොවේ. ඔබේ ක්‍රෙඩිට් කාඩ්පතට, ඊළඟ මාසයේ දී ගාස්තුව වෙනම බිල්ගත කෙරෙනු ඇත.

ප්‍ර:	මාගේ Priority Pass කාඩ්පත නොමැතිව මා හට විවේකාගාරයකට පිවිසිය හැකි ද?

පි:	කණගාටුයි, ඔබේ Priority Pass කාඩ්පත නොමැතිව කිසිදු විවේකාගාරයකට පිවිසිය නොහැක.

ප්‍ර:	විවේකාගාරයක් වෙත පිවිසීම සම්බන්ධයෙන් මා හට බිල්ගත කිරීම් සිදු කෙරෙන්නේ කෙසේ ද?

පි:	විවේකාගාරයට පිවිසීමේ ගාස්තුව වශයෙන් එක් කාඩ්පත් හිමියෙකුට ඇ.ඩො. 25/-ක් සහ එක් අමුත්තෙකුට ඇ.ඩො. 27/-ක් බැගින් ඔබගේ HSBC Visa Signature ක්‍රෙඩිට් කාඩ්පතට ඊළඟ මාසයේ දී සෘජුව ම බිල්ගත කෙරෙනු ඇත.

ප්‍රː මාගේ Priority Pass කාඩ්පත නැතිවුවහොත් / සොරකම් කරනු ලැබුවහොත් හෝ මා හට එම කාඩ්පත වෙනුවට නව කාඩ්පතක් අවශ්‍ය වුවහොත් මා විසින් කළ යුත්තේ කුමක් ද?

පිː ඔබගේ Priority Pass කාඩ්පත නැතිවුවහොත් / සොරකම් කරනු ලැබුවහොත් හෝ එයට හානියක් සිදුවුවහොත් හෝ කරුණාකර අංක 4 4722 75 හරහා වහාම අප අමතන්න. රු.2,500/-ක ගාස්තුවක් මත අප විසින් නව කාඩ්පතක් ඔබ වෙත නිකුත් කරනු ඇත.

ප්‍රː Priority Pass කාඩ්පත සම්බන්ධයෙන් මා හට කිසියම් මතභේදයක් හෝ ගැටළුවක් වේ නම්, මා සම්බන්ධ විය යුත්තේ කා සමග ද?

පිː ඔබගේ Priority Pass කාඩ්පත සම්බන්ධයෙන් කිසියම් මතභේදයක් හෝ ගැටළුවක් වේ නම්, පැය 24 පුරා ක්‍රියාත්මක පාරිභෝගික ක්ෂණික ඇමතුම් අංක 4 4722 75 හරහා ඔබට අප ඇමතිය හැකිය. කරුණාකර, Priority Pass කාඩ්පත භාවිතය සම්බන්ධයෙන් මෙයට අමුණා ඇති නීතිරීති සහ කොන්දේසි ද බලන්න.

**නීතිරීති සහ කොන්දේසිː**

- Priority Pass කාඩ්පත අන් අයෙකුට පැවරිය නොහැකි අතර, එය වලංගු වන්නේ එහි සඳහා අවලංගු වන දිනය දක්වා කාලය තුළ පමණක් සහ කාඩ්පත් හිමියා විසින් එහි අත්සන් තැබූ පසු පමණි.

- කාඩ්පත හිමියා හැරෙන්නට අන් කිසිවකු විසින් කාඩ්පත භාවිත නොකළ යුතු ය.

- Priority Pass කාඩ්පත යනු ගෙවීම් සිදු කරන කාඩ්පතක් නොවන අතර, ණය ලැබීමට සුදුසුකම් ලද බවට සහතිකයක් හෝ නොවන අතර, එවැනි කටයුත්තක් සඳහා භාවිත කිරීම වංචා කිරීමක් වශයෙන් සැලකෙනු ඇත.

- වලංගු කාඩ්පතක් ඉදිරිපත් කිරීමෙන් පමණක් විවේකාගාරයන්ට පිවිසීම සිදු කළ හැකි අතර, එය කොන්දේසි සහිත වේ.

- HSBC Visa Signature ක්‍රෙඩිට් කාඩ්පත, Priority Pass කාඩ්පත වෙනුවට භාවිත කළ හැකි ආදේශකයක් වශයෙන් පිළිගනු නොලබයි.

- සහභාගි වන විවේකාගාර ලැයිස්තුව www.prioritypass.com සහ www.hsbc.lk හි දැක්වේ.

- විවේකාගාරයන් වෙත පිවිසීම, කාඩ්පත් හිමියන් සඳහා එක් පිවිසීමකට, එක් පුද්ගලයෙකුට ඇ.ඩො. 25/-ක් සහ එක් අමුත්තෙකුට ඇ.ඩො. 27/-ක් බැගින් වේ. ඔබ සහ ඔබ සමග වූ අමුත්තන්ගේ එකී පිවිසීම්, ඔහුගේ/ඇයගේ Priority Pass සාමාජිකත්වය සම්බන්ධයෙන් බැංකුව විසින් දැනුම් දී ඇති අගයයන් හා නීතිරීතිවලට අනුව, ඊළඟ මාසයේ දී කාඩ්පත් හිමියාගේ ක්‍රෙඩිට් කාඩ්පතට හර කෙරෙනු ඇත.

- විවේකාගාර පිවිසීම් සඳහා අදාළ වන සියලු ගාස්තු සහ විවේකාගාර පිවිසීම් ගාස්තු පිළිබඳ වෙනස්වීම් බැංකුව විසින් කාඩ්පත් හිමියා හට දැනුම් දෙනු ඇත. විවේකාගාරය වෙත පිවිසීමට පෙර අදාළ සියලු ගාස්තු සහ සීමාකිරීම් පරීක්ෂාකර බැලීම කාඩ්පත් හිමියා සතු වගකීමකි.

- විවේකාගාරයට ඇතුළු වී Priority Pass කාඩ්පත ඉදිරිපත් කරන අවස්ථාවේ දී, විවේකාගාර කාර්ය මණ්ඩලය විසින් එම කාඩ්පතෙහි පිටපතක් ලබාගෙන 'පිවිසීමේ වාර්තා' වවුචරයක් කාඩ්පත් හිමියා වෙත නිකුත් කරනු හෝ ලොග් සටහනක් යොදනු හෝ ඇත. ඇතැම් විවේකාගාරයන් හි කාඩ්පත් කියැවීමේ ඉලෙක්ට්‍රොනික තාක්ෂණය ඇති අතර, එමගින් Priority Pass කාඩ්පතෙහි පිටුපස ඇති චුම්බක තීරයෙන් කාඩ්පත් හිමියාගේ තොරතුරු ලබාගනු ඇත. කාඩ්පත් හිමියා සමග අමුත්තන් ද විවේකාගාරයට පිවිසියේ නම්, එකී අමුත්තන් සංඛ්‍යාව නිවැරදිව දැක්වෙන 'පිවිසීමේ වාර්තා' වවුචරය කාඩ්පත් හිමියා විසින් ඒ අනුව අත්සන් කළ යුතු වුවද, එක් අයෙකු සඳහා එක් පිවිසීමකට අය කෙරෙන ගාස්තුව එහි සඳහන් නොවනු ඇත. එක් පිවිසීමකට කාඩ්පත් හිමියා සඳහා ගාස්තුව සහ අදාළ තන් හි දී, අමුත්තන් සිටියේ නම්, ඔවුන් සඳහා වන ගාස්තු ද විවේකාගාර මෙහෙයුම්කරු විසින් ඉදිරිපත් කරනු ලබන 'පිවිසීමේ වාර්තා' වවුචරය / ලොග් සටහන මත පදනම් වනු ඇත.

- Priority Pass කාඩ්පතෙන් වවුචර් පිටපතක් ලබාගැනීම/ලොග් සටහනක් තැබීම විවේකාගාර කාර්ය මණ්ඩලයේ වගකීමක් වන අතර, 'පිවිසීමේ වාර්තා' වවුචරය/ලොග් සටහන නිවැරදිව සිය භාවිතය සටහන් කර ඇති බවට සහ විවේකාගාරය භාවිතයේ දී තමා සමග අමුත්තන් සිටියේ ද යන්න පිරික්සා, සහතික වීම කාඩ්පත් හිමියාගේ වගකීමකි. අදාළ තන් හි දී, විවේකාගාරයේ දී තමා වෙත ලබා දුන් 'පිවිසීමේ වාර්තාව' හි 'කාඩ්පත් හිමියාගේ පිටපත' ළඟ තබාගැනීම කාඩ්පත් හිමියාගේ වගකීම වේ.

- සහභාගිවන සියලුම විවේකාගාරයන් හි අයිතිය හා ඒවායෙහි මෙහෙයුම් කටයුතු තුන්වන පාර්ශ්වයේ ආයතනයන් සතු ව පවතී. කාඩ්පත් හිමියා සහ ඔහු සමග පිවිසෙන අමුත්තන්, සහභාගිවන එක් එක් විවේකාගාරයේ/සමාජශාලාවේ නීතිරීති සහ ප්‍රතිපත්ති පිළිගත යුතු වේ.

- ඉඩ-කඩ සීමාවීම හේතුවෙන් පිවිසීම් සීමා කළ හැකි නමුත් එය සිදු කරනු ලබන්නේ එක් එක් විවේකාගාර මෙහෙයුම්කරුගේ පරම අභිමතය පරිදි වේ. පිරිනමනු ලබන පහසුකම්, විවෘත කරන සහ වසා දමන වේලාවන් හෝ විවේකාගාරයන් හි සේවයට යොදවා ඇති පුද්ගලයින් සම්බන්ධ කිසිදු පාලනයක් බැංකුව සතු නොවේ.

- ප්‍රචාරණය කර ඇති පරිදි සියලු ප්‍රතිලාභ සහ පහසුකම් පවතින බවට සහතික වීම සම්බන්ධයෙන් ගත හැකි සියලු උත්සහයන් බැංකුව විසින් දරනු ඇති නමුත්, කාඩ්පත් හිමියා පිවිසෙන වේලාවෙහි දී එකී ප්‍රතිලාභ සහ පහසුකම් තිබෙන බවට කිසිදු සහතිකයක් හෝ වගකීමක් බැංකුව ලබා නොදෙයි.

- ප්‍රචාරණය කරන ලද ප්‍රතිලාභ සහ පහසුකම් සලසා සිටීම හෝ සලසා නොසිටීම (පූර්ණ හෝ අර්ධ හෝ) හේතුවෙන් කාඩ්පත් හිමියා, හෝ ඔහු/ඇය සමග පිවිසෙන අමුත්තන් වෙත පැනනගින කිසිදු අලාභයක් පිළිබඳව බැංකුව වගකියනු නොලබයි.

- විවේකාගාර ලැයිස්තුගත කිරීම්වල අන්‍යාකාරයකින් සඳහන් කර නොමැති නම්, ඔබ සමග විවේකාගාර වෙත පිවිසෙන සියලු දරුවන් (අවසර දී ඇති අවස්ථාවන් හි) අමුත්තන් සඳහා වන සම්පූර්ණ ගාස්තුවට විෂය වේ.

- අතිවාසය (overcrowding) වැළැක්වීම සඳහා සහභාගි වන විවේකාගාරයන් විසින් විවේක ගන්නා උපරිම කාලය පිළිබඳ (සාමාන්‍යයෙන් පැය 3-4) ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීමේ අයිතිය රඳවා ගත හැකි ය. විවේකාගාරය තුළ දිගු කාලයක් ගත කිරීම සම්බන්ධයෙන් එක් එක් විවේකාගාර මෙහෙයුම්කරු විසින් සිය අභිමතය පරිදි ගාස්තුවක් අය කරනු ඇත.

- මධ්‍යසාර පාන වර්ග නොමිළයේ සැපයීම (දේශීය නීති මගින් අවසර ඇති අවස්ථාවන් හි) එක් එක් විවේකාගාර මෙහෙයුම්කරුගේ අභිමතය පරිදි වන අතර, ඇතැම් අවස්ථාවන් හි දී එය සීමාසහිත විය හැකි ය. එවැනි විටෙක, අමතර පරිභෝජනය සඳහා වන ගාස්තු කිසිවක් වේ නම්, එකී ගාස්තු ඍජුව ම විවේකාගාර කාර්ය මණ්ඩලය වෙත ගෙවීම කාඩ්පත්

හිමියාගේ වගකීම වේ. (වැඩි විස්තර සඳහා Priority Pass වෙබ් අඩවියෙහි එක් එක් විවේකාගාරය පිළිබඳ විස්තරය බලන්න).

- එක් එක් විවේකාගාරයට අනුව දුරකථන පහසුකම් (ලැබිය හැකි විට දී) වෙනස්වන අතර, විවේකාගාර මෙහෙයුම්කරුගේ අභිමතය පරිදි එකී පහසුකම් සැපයීම සිදු කෙරේ. සාමාන්‍යයෙන්, නොමිලේ භාවිතය, දේශීය ඇමතුම් සඳහා පමණක් සීමා වේ. දුරකථන, ෆැක්ස්, අන්තර්ජාල, Wi-Fi, කෑම-බීම, ස්නානය සහ ස්පා සත්කාර ගාස්තු (අදාළ අවස්ථාවන්හි දී) එක් එක් විවේකාගාර මෙහෙයුම්කරුගේ අභිමතය පරිදි වන අතර, එකී ගාස්තු ඍජුව ම විවේකාගාර කාර්ය මණ්ඩලය වෙත ගෙවීම කාඩ්පත් හිමියාගේ වගකීමකි.

- කාඩ්පත් හිමියන් සහ අමුත්තන් සතු ව එදින ම සංචාරය සඳහා වලංගු ගුවන් ටිකට්පත් තිබීමට යටත් ව පමණක් විවේකාගාර වෙත පිවිසීම කළ හැකි වේ. ඇමෙරිකා එක්සත් ජනපදයෙන් පිටත දී, පිටව යන ගුවන් යානාව සඳහා ගුවන් ටිකට්පත සමග ගුවන් යානයට ඇතුළුවීම සඳහා වලංගු පාස්පතක් (boarding pass) තිබීම අනිවාර්ය වේ. එනම්, රටින් පිටතට යන මගීන් සඳහා පමණි. යුරෝපයේ ඇතැම් විවේකාගාරයන් ස්ථානගත කර ඇත්තේ ගුවන් තොටුපලෙහි දක්වා ඇති ෂෙන්ගන් (Schengen) ප්‍රදේශයන් තුළ පමණක් බව කරුණාවෙන් සලකන්න. එනම්, මෙම විවේකාගාරයන් වෙත පිවිසීමට අවසර ලැබෙනුයේ ෂෙන්ගන් රටවල් අතර පමණක් සංචාරය කරන සාමාජිකයන් සඳහා පමණි. (ඔස්ට්‍රියා, බෙල්ජියම්, චෙක් ජනරජය, ඩෙන්මාර්කය, එස්ටෝනියාව, ෆින්ලන්තය, ප්‍රංශය, ජර්මනිය, ග්‍රීසිය, හන්ගේරියාව, අයිස්ලන්තය, ඉතාලිය, ලැට්වියාව, ලිතුවේනියාව, ලක්සම්බර්ග්, මෝල්ටා, නෙදර්ලන්තය, නෝර්වේ, පෝලන්තය, පෘතුගාලය, ස්ලොවේකියාව, ස්ලොවේනියාව, ස්පාඤ්ඤය, ස්වීඩනය සහ ස්විට්සර්ලන්තය.)

- විවේකාගාරයන් වෙත පිවිසීම, සාමාජිකයා සහ අමුත්තන් (දරුවන් ඇතුළුව) වේ නම්, ඒ සැමදෙනාගේම ක්‍රමවත් හා නිවැරදි හැසිරීම හා උචිත ඇඳුම්-පැළඳුම් හැඳ සිටීමට (ඇ.එ.ජ. පිටත කෙටි කලිසමට අවසර නොමැත) විෂය වේ. වෙනත් භාවිත කරන්නන්ගේ සැප-පහසුවට බාධා වන අන්දමින් හැසිරෙන ළදරුවන්ට හෝ දරුවන්ට විවේකාගාරයෙන් පිටවන ලෙසට ඉල්ලා සිටිය හැකි වේ. සාමාජිකයා සහ/හෝ අමුත්තන් මෙකී කොන්දේසිවලට අනුව කටයුතු නොකිරීම හේතුවෙන් විවේකාගාර මෙහෙයුම්කරු විසින් පිවිසීමට අවසර ලබානොදීම මගින් සාමාජිකයාට සහ අමුත්තන් කිසිවකු හට සිදුවන කිසිදු අලාභයක් සඳහා බැංකුව වගකියනු නොලැබේ.

- නැති වූ, සොරකම් කළ හෝ හානි සිදු වූ Priority Pass කාඩ්පත් සම්බන්ධයෙන් වහාම බැංකුව දැනුවත් කළ යුතු වේ. වැඩ කරන දින 14ක් ඇතුළත දී, එක් කාඩ්පතක් සඳහා රු.2,500/-ක ගාස්තුවක් යටතේ බැංකුව විසින් නව කාඩ්පතක් නිකුත් කරනු ඇත. කාඩ්පත් හිමියකු විසින් වලංගු නැති කාඩ්පතක් භාවිතයෙන් කිසියම් විවේකාගාර පිවිසීමක් සිදු කළහොත්, අමුත්තන් සහ කාඩ්පත් හිමියා සඳහා, කාඩ්පත් හිමියාගෙන් අය කෙරෙනු ඇත.

- මෙම දීමනාවට අදාළව මෙහි අඩංගු නීතිරීති සහ කොන්දේසි ද ඇතුළුව නීතිරීති සහ කොන්දේසි කිසිවක් හෝ සියල්ල සංශෝධනය කිරීමට, වෙනස් කිරීමට හෝ ඉවත් කරගැනීමට බැංකුව අයිතිය රඳවාගනියි.

ද හොං කොං ඇන්ඩ් ෂැංහයි බැන්කින් කෝර්පරේෂන් ලිමිටඩ් - ශ්‍රී ලංකා විසින් නිකුත් කරන ලදී.